# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/14 - 2013 ජුනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

#### රේගු නිවේදනයයි

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 01/2013

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

***1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත***

*ආඥාව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, 2013 ජුනි මස 21 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.)

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 001656 — 960 (2013/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| 71.08 | | | **සකස් නොකළ හෝ අඩ වශයෙන්, නිෂ්පාදිත ස්වරූපවලින් යුත්, හෝ කුඩු ආකාරයෙන් වූ, රත්රන් (ප්ලැටිනම් සමග ආලේපිත, රත්රන් ඇතුළුව)** | | | |
| | | | | | | |
| | | - | මුල්‍ය නොවන : | | | |
| | 7108.11 | -- | කුඩු | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 5% | කි. ග්‍රෑ. |
| | 7108.12 | -- | අනෙකුත් සකස් නොකළ | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 5% | කි. ග්‍රෑ. |
| | 7108.13 | -- | අනෙකුත් අර්ධ වශයෙන් නිෂ්පාදිත ස්වරූපවලින් යුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 5% | කි. ග්‍රෑ. |
| | 7108.20 | - | මුදල් හා සම්බන්ධ වූ (මුල්‍යමය) | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 5% | කි. ග්‍රෑ. |

07 - 138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.